ඩේලි F.T. පිටුව 06.

# 2019 අවසානයේ ආර්ථික අපේක්ෂාව

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2019 මැයි, ජූනි, ජූලි යන මාසවලදී තෝරාගත් 800 දෙනකුගෙන් යුතු කාන්තා සහ පිරිමි අහඹු නියැදියක් භාවිත කරමින් ඉදිරි මාස 04 තුළ හා ඉදිරි වසර සඳහා ඔවුන්ගේ ආර්ථික අපේක්ෂාවන් පිළිබඳව සිදුකළ මුහුණට මුහුණ සමීක්ෂණයක තොරතුරු පසුගියදා නිකුත් කෙරුණා.

ඒ අනුව එම අරමුණු පහත පරිදි වනවා.

ආර්ථික අපේක්ෂාව පිළිබඳ 2019 මැයි, ජූනි, ජූලි මාසවල දත්ත විමසා බැලීමේදී පෙනී යන්නේ ඉදිරි මාස 04 තුළ හා ඉදිරි වසර සඳහා සැලකිල්ලට ගත් කල තම රැකියාවේ තත්ත්වය හෝ ව්‍යාපාරය වැඩිදියුණු කර ගැනීම කෙරෙහි ජනතාවගේ අපේක්ෂාව මෙම කාර්තුව තුළදී සමස්තයක් ලෙස 2018 හතර වැනි කාර්තුවට සාපේක්ෂව අඩු වී තිබෙන බවයි.

මේ අනුව මෙම අපේක්ෂාව පිට පිටම කාර්තු තුනක් පහළ ගොස් තිබෙන අතර 2019 පළමු කාර්තුවේ සිට මෙම පහළ යෑම ආරම්භ වුණා. 2019 පළමු කාර්තුවේදී ඉදිරි මාස 12 සැලකිල්ලට ගත් කල තම රැකියාවේ තත්ත්වය හෝ ව්‍යාපාරය වැඩිදියුණු කර ගැනීම කෙරෙහි ජනතාවගේ අපේක්ෂාව 2018 තුන්වැනි කාර්තුවට සාපේක්ෂව පහළ ගියා.

විශේෂයෙන්ම 2018 නොවැම්බර් මාසයේදී ශ්‍රීලංකාවේ සිදුවූ අනපේක්ෂිත දේශපාලන පරිවර්තනය නිසා ඇති වූ අස්ථාවර ස්වභාවය මෙම අපේක්ෂාව නොවැම්බර් මාසයේ සිට පහළ යෑමට හේතුවක් වන්නට පුළුවන් අතර මෙම කාලයේදී විදේශ විනිමයට සාපේක්ෂව රුපියල වේගයෙන් අවප්‍රමාණය වීම සිදුවිය. රට තුළ දේශපාලන අවිනිශ්චිත ස්වභාවයක් 2019 පළමු කාර්තුව තුළද දකින්නට ලැබුණා.

ශ්‍රී ලංකා මහ බැංකුව පවසන්නේ රටේ ආර්ථික කටයුතු ප්‍රසාරණය වීම සඳහා ඉතාමත් වැදගත් පෞද්ගලික අංශය වෙත බැංකු ක්‍රමයෙන් සැපයූ ණය ප්‍රමාණය 2019 මුල් මාස දෙක තුළදී 2018 හතර වැනි කාර්තුවේ පෙන්වූ සැලකිය යුතු ඉහළ යෑමට සාපේක්ෂව අඩු වූ බවයි. මහ බැංකුව පවසා තිබෙන්නේ 2019 වසර සහ ඉන් ඉදිරියට මෙරට උද්ධමනය 4%-6%ත් අතර පරාසයක පවතිනු ඇති බවයි.

ඉදිරි මාස 12 සැලකිල්ලට ගත් කල තම රැකියාවේ තත්ත්වය හෝ ව්‍යාපාරය වැඩිදියුණු කර ගැනීම කෙරෙහි ජනතාවගේ අපේක්ෂාව 2019 පළමු කාර්තුව තුළදී (ජනවාරි, පෙබරවාරි, මාර්තු) 2018 හතර වැනි කාර්තුවට සාපේක්ෂව පහළ ගිය ආකාරය පහත ප්‍රස්තාරය මඟින් පැහැදිලි වේ.

ඉදිරි මාස 12 ඇතුළත උපයන මුදලින් යම්කිසි ප්‍රමාණයක් ඉතිරි කිරීමට තිබෙන හැකියාව පිළිබඳව තිබෙන අපේක්ෂාවද 2019 අවසාන කාර්තුව තුළදී 2018 හතර වැනි කාර්තුවට සාපේක්ෂව පහළ ගොස් තිබෙනවා.

2018 හතර වැනි කාර්තුවේදී පහළ ගිය මෙරට දූෂණය අඩු වන බලාපොරොත්තුව 2019 අවසාන කාර්තුව තුළදී යළිත් ඉහළ ගොස් තිබීම කැපී පෙනෙන සිදුවීමකි.

